ඇඹිලිපිටිය කලාපය

දෙවන වාරය පාඩම් මාලාව-2020

සිංහල භාෂාව හා සාහිත්‍යය-8 ශ්‍රේණිය

09.අවුරුදු සිහිනය-හතරවන පාඩම.

- ගුණදාස අමරසේකර මහතා මෙරට සිංහල සාහිත්‍ය සඳහා මහඟු මෙහෙවරක් කළ ලේඛකයෙකි. නවකතා,කෙටිකතා සංග්‍රහ,කාව්‍ය සංග්‍රහ රාශියක් ලියා පළකොට ඇත.

1. මෙතුමා ලියන ලද ග්‍රන්ථ මොනවාද? වෙන් වෙන්ව ලියා දක්වන්න.

- මෙරට කෙටිකතා ක්ෂේත්‍රයට මහඟු සේවයක් ඉටුකළ කෙටිකතාකරුවන් බොහොමයක් දෙනෙක් සිටිති.

2. එවන් කෙටිකතාකරුවන් පස් දෙනෙකුගේ නම් සහ,පළකළ කෙටිකතාවේ නම ලියා දක්වන්න.
3. ඔබ කියවා ඇති කැමතිම කෙටිකතාවක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
4. පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින්, කා හට,කුමන අවස්ථාවකදී කියන ලද්දැයි ලියා දක්වන්න.
   I. "මොකක්ද, මට තේරෙන්නේ නැහැ"
   II. "මොකක්ද ගේන්න කිවුවේ?"
   III. "නැහැ, මට ඇහුණේ නැහැ"
   IV. "ඔවු, කියන්න කොහොම හරි මාව එක්කන් යන්න එන්න කියලා හෙට උදේම"
   V. "නෑ ඒවා ඔක්කොම හරි".

5. ඔබේ ජීවිතයේ වඩාත්ම සිත් ගත් සිදුවීමක් ආශ්‍රයෙන් කෙටිකතාවක් නිර්මාණය කරන්න.